**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2020**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලද, වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

----------------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 70 ඡේදයප්‍රකාරව මුළුවත්කම් ද්‍රවශීලතා අනුපිළිවෙල අනුව ඉදිරිපත්කර නොතිබුණි | පෙන්වා දුන් අඩුපාඩුව පිළිගත් අතර 2021 වසර සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව | ශ්‍රී ලංකා රාජ්‍යඅංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කල යුතුයි. |
| (ආ) | බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය මඟින්"නව නිර්මාණසාරි 100" නමින් බතික් මෝස්තර සාරි නිර්මාණය සඳහාවූ ව්‍යාපෘතියක් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කිරීමට තරම් ස්ථිර හා ස්ථාවර තත්වයක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම පිළිබඳව 2020 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වාර්තාකරන දිනට පැවති තත්ත්වයන්ට සාක්ෂි සපයන සිදුවීමක් බැවින් , මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කලයුතුයි. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 03 ක් 2020 දෙසැම්බර් 31 දිනැති චෙක්පත 2021 ජනවාරි මසදී ලැබී තිබුණි., නිෂ්පාදන අලෙවිකිරීම සඳහා සළුසල ආයතනය සමඟ 2021 ජනවාරි 27 දින අවබෝධතා ගිවිසුමකටද අත්සන් තබා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06 ප්‍රකාරව මෙය මූල්‍ය ප්‍රකාශන වාර්තාකරන දිනට පැවති තත්ත්වයන්ට සාක්ෂි සපයන සිදුවීමක්වුවද, මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | වර්ෂයේ නොතිබූ බැවින් එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් නොකරන ලද බව. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 15 හි 21 ඡේදය ප්‍රකාර ප්‍රවර්තන කාල පරිච්ඡේදයට අදාළව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වල අයවැය ලේඛනයේ වටිනාකම හා තත්‍ය වටිනාකම් අතර සැසඳීමක් අතිරේක වැය තීරුවක් ලෙස ඉදිරිපත් කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එක්එක් වියදමට අදාල අයවැයගත වටිනාකම ඉදිරිපත්කර නොතිබුණි. | පෙන්වා දුන් අඩුපාඩුව පිළිගත් අතර ඉදිරි වසර වල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කල යුතුයි. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 37 ඡේදය ප්‍රකාරව රු.2,495,693 ක්වූ ලැබියයුතු ශේෂ තුළ ඇතුළත් අයකර ගැනීම අවිනිශ්චිත ශේෂයන් සඳහා හානිකරණ අගයන් ගණනය කර සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශ වල දැක්වීමට කටයුතු කර නොතිබුණි | තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර සියයට 2.5 ක හෝ සුදුසු ප්‍රතිශතයකින් අඩමාන ණය වෙන් කිරීමට පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට 2021 ගිණුම් වර්ෂයේදී කටයුතු කරන බව. | අවිනිශ්චිත ශේෂයන් සඳහා හානිකරණ අගයන් ගණනය කර සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශ වල දැක්වීමට කටයුතු කල යුතුයි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම් වල වටිනාකම රු.62,566,825 ක්වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම ස්ථාවර | මෙම වෙනසට හේතු වී ඇත්තේ යන්ත්‍රෝපකරණ කාර්යාල උපකරණ ලී බඩු හා සවිකිරීම් වලට අදාල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොවීම සහ ඉවත්කරන ලද වත්කම් පොත් | ස්ථාවර වත්කම් සහ උපලේඛන අතර වෙනස්කම් හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණනය කර නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වත්කම් වල වටිනාකම රු.78,965,697 ක් වීමෙන් රු.16,398,872 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි. | වලින් ඉවත් නොවීමයි. 2020 වර්ෂය තුළ වත්කම් පන්තීන් අනුව ප්‍රත්‍යාගණනය කර ලේඛන තවදුරටත් යාවත්කාලීන කිරීම තුළින් මෙම වෙනස අවම කර ගැනීමට කටයුතු කරන බව. | |
| (ආ) | වෙළඳ හා වෙනත් ලැබියයුතු ශේෂ යටතේ ශ්‍රීලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් ලැබිය යුතු බවට රු.513,115 ක ශේෂයක් දක්වා තිබුණද, ශේෂ සනාථන ලිපිය ප්‍රකාරව එදිනට ගෙවියයුතු ශේෂය රු.587,250 ක් බැවින් රු.74,135 ක වෙනසක්ද ජාතික ශිල්ප සභාවෙන් අයවිය යුතු බවට රු.64,006 ක ශේෂයක් දක්වා තිබුණද, ශේෂ සනාථන ලිපිය ප්‍රකාරව එදිනට ගෙවිය යුතු අගයක් නොතිබුණි. | රු.74,135 ක වෙනසට හේතුන් සොයමින් පවතින බව | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය |
| (ඇ) | මධ්‍යස්ථානය විසින් ක්‍රමක්ෂය ගණනය කිරීමේදී භාණ්ඩාගාර අරමුදල් වලින් මිලදීගත් වත්කම් මෙන්ම උපයාගත් අරමුදල් වලින් මිලදීගත් වත්කම් සඳහාද ක්‍රමක්ෂ යගණනය කිරීම හේතුවෙන් 2020 වර්ෂය තුළ විලම්භිත ආදායම් රු458,037කින් වැඩියෙන් දක්වා තිබුණි | උපයාගත් අරමුදල් වලින් මිලදීගත් වත්කම් සඳහාද අතපසුවීමකින් ක්‍රමක්ෂය ගණනය වීමෙන් වූ වරද පිළිගන්නා බවත් මේ අනුව ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | නිවැරදි වටිනාකම් ගණනය කොට ගිණුම්ගත කල යුතුයි. |

## 1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේඅ දහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන මුදල් රෙගුලාසි සංශෝධන | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවද, අත්තිකාරම ලබාගත් | මාර්තු අප්‍රේල් මාස වල පැවති ඇඳිරි නීති තත්වය මත හා රෝස්ටර් ක්‍රමයට සේවයට කැඳවීම හේතුවෙන් අත්තිකාරම් නිරවුල් | චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් නිරවුල් කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව මුදල් රෙගුලාසි 371 (5) | නිලධාරීන් විසින් කාර්යය අවසන් වුවද, එම අත්තිකාරම් පියවීමට දින 6 සිට දින 96 දක්වාකාල පරාසයක් ගතවී තිබුණි. | කිරීම ප්‍රමාද වූ බව | |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණිත ගිණුම් සමඟ වාර්ෂික වාර්තා භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2018 සහ 2019 වර්ෂ වල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2018 හා 2019 වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 105 හා 109 (1) සහ 109 (2) | වාහන අනතුරු 2කට අදාලව එකතුව රු.65,991 ක් වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර . මෙලෙස අලාභය අයකර ගැනීමට නොහැකි නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොතෙන් අස් කිරීමේ නියෝගය හෝ අත්හැර දැමීමේ නියෝගය ලබාගෙන නොතිබුණි | මුදල කපාහැරීමක් සිදුවී නොමැති අතර අයවිය යුතු මුදලක් ලෙස පොත් වල සටහන් කර ඇති බව හා ඉදිරියේදී පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,045,574ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,288,623 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු2,756,951 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු ආදායම රු.11,480,781කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නව කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.71,867,031 ක් ගෙවීම් කර තිබුණද ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙනයනු ලබන කටුබැද්ද පිහිටි ඉඩම හා ව්‍යාපෘති කාර්යාලය පිහිටි නත්තරම්පොත ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමට අපොහොසත්වී තිබුණි. . | නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා කටයුතු ආරම්භ කිරීමේදී මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතියද ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමට උපදෙස් ලද අතර, එහි මූලික කටයුතු සියල්ල මේ වනවිට සිදුකර ඇත. මේ වනවිට ඉඩමෙහි පිඹුරුපත් සකස් කර මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව හා නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය පිහිටි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමට අදාල කටයුතුමේ වන විට සිදුකරමින් පවතින බව. | ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමට නොපමාව කටයුතු කල යුතුයි. |
| (ආ) | නව කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීමට අවසර ලබාගැනීමට නාගරික සංවර්ධන අධිකාරියෙන් සංවර්ධන බලපත්‍රය ලබාගැනිම සඳහා ඉදිකිරිමට නියමිත ගොඩනැගිල්ලට යාවකාලීන හරිත සහතිකයක් (Provincial Green Certificate) ලබා ගෙන තිබිම අනිවාර්යයවුවත්, එම සහතිකය ලබා ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි | 2018 වර්ෂයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමත් සමහම හරිත සහතිකය සඳහාද ඉල්ලීම් කල අතරමෙම හරිත සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ගොඩනැගිල්ලේ උපදේශක සමාගම වන ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර නීත්‍යානුකූල අවශ්‍යතා ඉටුකල යුතුයි |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණ ජාතික ඩිප්ලෝමාව සහ ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණ උසස් ජාතික ඩිප්ලෝමාව යන පාඨමාලා සඳහා එක් සිසුවෙකුගෙන් රු.90,000 ක් බැගින් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2018 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2020 අප්‍රේල් මස අවසන් කිරීමට නියමිතව තිබුණු අතර, 2021 මාර්තු 31 දින වන විටත් එම පාඨමාලාවෙහි අවසන් ප්‍රතිඵල නිකුත්කර නොතිබුණ අතර. මෙම පාඨමාලාවන් සඳහා 2021 වර්ෂයේ ශිෂ්‍ය බඳවාගැනීම් සිදුකර නොතිබුණි.පාඨමාලාවන් තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචිය 2014 පෙබරවාරි 24 දින සිදුකර තිබුණද, ලියා පදිංචි කොට වසර 07 ක් ගතවීඇතත් NVQ මට්ටමට උසස්කිරීමට මේදක්වා නොහැකිවී තිබුණි. මේ හේතුවෙන් ශිෂ්‍යයන් සඳහා නිකුත්කරනු ලබන සහතිකපත්‍රය ක්ෂේත්‍රය තුළ පිළිගත් සහ වටිනාකමකින් යුක්ත සහතිකපත්‍රයක් නොවන අතර, හුදෙක් පාඨමාලාව සම්පූර්ණ කළබවට අධ්‍යක්ෂවරයාගේ සහ සභාපතිවරයාගේ අත්සනින් නිකුත්කළ සහතික පත්‍රයක් පමණක් වීතිබුණි. | **2018** වර්ෂයේදී **NVQ 5** මට්ටමට උසස් කිරීම සඳහා මූලික සැලසුම් සැකසීමේදී දේශන පැය ගණන වැඩි බැවින් දේශන හා පරිපාලන ගාස්තු වැඩි වූ නිසා රු**. 90,000/-** ලෙස පාඨමාලා ගාස්තු අධ්‍යක්ෂතුමාගේ අනුමැතියෙන්සංශෝධනය කර ඇති බවත්,.ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිත බවත්,කොරෝනා වසංගත තත්වය හේතුවෙන් පාඨමාලාව නිම කිරීමට කල් ගත වූ බවත්,විභාග ප්‍රතිඵල මැයි මස නිකුත් කිරීමට නියමිත බවත්, 2021වසර ආයතනයේ වෙබ් අඩවිය හරහා සිසුන් 256ක් ඉල්ලුම් කර තිබූ අතර සම්මුඛ පරීක්ෂණ පවත්වා සිසුන් 44ක් පාඨමාලාව සඳහා තෝරා ගෙන ඇති බව හා මෙම පාඨමාලාව NVQමට්ටමට සැකසීම සඳහා මූලික කටයුතු තෘතීය හා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ එකට කටයුතු කරමින් දැනට විෂය නිර්දේශයේ මූලික කටයුතු අවසන් කර ඇති බව**.** | පාඨමාලා ගාස්තු අයකිරීම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගතයුතු අතරම පාඨමාලාවේ ගුණාත්මක භාවය සඳහා පිළිගත් සහතිකයක් නිකුත් කල යුතුයි |

### 3.3 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එක්ව 2014 දෙසැම්බර් 08 දිනැති ගිවිසුම ප්‍රකාරව මඩකලපුව, මන්නාරම, වවුනියාව, අනුරාධපුර, මොණරාගල, පුත්තලම හා අම්පාර යන දිස්ත්‍රික්ක වල හස්ත කර්මාන්ත ශිල්පීන් හා ශිල්පීය කණ්ඩායම් සඳහා ශිල්පීය තාක්ෂණික හැකියා සංවර්ධනය සහ උපදේශක සහය ලබාදීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.51,313,305 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි.UNDP ආයතනයවිසින් 2018 ජනවාරි 15 දිනැතිව නිකුත් කරනලද ලිපිය මගින් දැනුම්දී ඇති පරිදි 2018 පෙබරවාරි 28 දින වනවිට අවසන් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කළයුතුව තිබුණද, ව්‍යාපෘතිය අවසන් කොට නොතිබුණු අතර ඉතිරිවූ රු.2,312,228 ක මුදල ඌන උපයෝජිතව පැවතුණි. | කොවිඩ් තත්වය හේතුවෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව | ලද ප්‍රතිපාදනයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කලයුතුයි |

### 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොවිඩ් අවදානම හේතුවෙන් 2020 වර්ෂය තුළ පැවැත්වීමට නොහැකිවූ බතික් මෝස්තර නිර්මාණ ප්‍රදර්ශනය 2021 වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම්කර නොතිබුණි. ඒඅනුව 2020 දෙසැම්බර් 31 දින ප්‍රදර්ශනය වෙනුවෙන් දරනලද රු.1,023,791 ක වියදම් නිශ්කාර්‍යය වී තිබුණි. | ඉදිරි වර්ෂ වල පැවැත්වෙන ප්‍රදර්ශන සඳහා උපාංග වෙනුවෙන් දැරීමට අවශ්‍ය නොවන බව | සියළුවියදම් සැලසුම් සහගතව අවශ්‍යතාවය අනුව සිදු කලයුතුයි. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව දෙමහල් ගොඩනැගිල්ල වායු සමීකරණය කිරිමේ කොන්ත්‍රාත්තුව රු.3,691,058 ට මුදලකට පෞද්ගලික ආයතනයක් වෙත 2020 සැප්තැම්බර් 28 දින භාරදී තිබුණි.ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණ අතර 2.8.1. (ඇ) ප්‍රකාරව ලංසු ඇගයීම, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතට භාර කර තිබුණි.ඒ අනුව මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1 (ආ) වගන්තියේ ප්‍රතිපාදනයන්ගෙන් බැහැරව තාක්ෂණික ඇගයීම් කමිටුවක අධීක්ෂණයක් හෝ මාර්ගෝපදේශකත්වයක් නොමැතිව උපදේශකවරයා විසින් ලංසු ඇගයීම් පිළිබඳ වාර්තාව සකස් කර තිබුණි.ඉංජිනේරු ඇස්තමේන්තුව රු2,501,400 ක් වුවද එම අගය සියයට 47.6 ක් ඉක්මවූ ඉදිරිපත් වූ වැඩිම ලංසු මිලට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 වගන්තියෙන් බැහැරව උපදේශකවරයා විසින් උක්ත කොන්ත්‍රාත්කරු නිර්දේශ කර තිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලැබුණු මුලා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ උපදෙස් පරිදි බාහිර ආයතනයක් ලවා සිදු කර ගැනීමට කටයුතු කරන ලදී. මෙහිදී සමස්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා තෝරාගෙන පත් කරන ලද උපදේශක සමාගමම මෙම වායු සමීකරණ පද්ධතිය සවි කිරීමේ කටයුතු සඳහාද අවශ්‍ය තාක්ෂණික නිර්දේශ ලබා දෙන ලදී. එබැවින් වායු සමීකරණ පද්ධතිය සවි කිරීම සඳහා වෙනමම තාක්ෂණික කමිටුවක් පත් නොකළ බව | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කලයුතුය |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා 2020 වර්ෂය තුළදී පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 02 කදී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වශයෙන් කටයුතුකර තිබුණි.කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් සහිතව නිලධාරියකු බඳවා ගැනීමකින් තොරව 2021 ජනවාරි 01 දිනසිට බලපැවැත්වෙන පරිදි මාසිකව රු.30,000 බැගින් ගෙවීමේ පදනම මත මාස 03 ක කාලයක් සඳහා පැවරුම් පදනම මත නව නිලධාරියකු පත්කර තිබුණි. | සභා ලේකම් හා සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර ලෙසට JM 1-1 කාණ්ඩයේ තනතුරක් අනුමත කරගැනීමට රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කලද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් මගින් එවැනි තනතුරක් අනුමත කළ නොහැකි බවත් සභා ලේකම් තනතුර සඳහා නැවත මු. රෙ. 70 යටතේ වෙනමම ඉල්ලුම් කරන ලෙසට උපදෙස් ලබා දුන් අතර ඒ අනුව විධිමත් පරිදි බඳවා ගන්නා තෙක් අධ්‍යක්ෂමණ්ඩල ලේකම් තනතුරෙහි කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ බාහිර අයෙකුගේ සේවය ලබාගන්නා ලෙසට උපදෙස් ලබාදුන් බව හා ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමැතිය ලබාගෙන අදාල බඳවාගැනීම් කල යුතුයි |
| (ආ) මධ්‍යස්ථානයේ අනුමත සේවක සංඛ්‍යාව 116 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව 85 ක් සහ සේවක ඌනතාවය 31 ක් විය.තත්‍ය සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවෙන් 73% ක් වූ අතර, අනුමත සේවක සංඛ්‍යාවෙන් 27% ක් වූ සේවක ඌනතාවය තුළ | ඉදිරියේදී තනතුරු සඳහා විධිමත් පරිදි බඳවාගැනිම් සිදු කරන බව | ආයතනයේ අරමුණු නොපිරිහලා ශිල්පීන්ට ඉටු කිරීම සඳහා අනුමත සහ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ඉහළ කළමනාකරණය ක්‍රියා කළ යුතුය |

ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවකයින් 01 ක්ද, ද්විතියික, තෘතියික හා ප්‍රාථමික මට්ටමේ සේවකයින් පිළිවෙලින් 10, 14, ක් හා 06 ක් විය.2020 වර්ෂය තුළද මෙම සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය මඟින් 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම්, අරමුණු23 ක් යටතේ කාර්තුමය වශයෙන් සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තා මඟින් ප්‍රමාණවත් පරිදි එකී සියළු ක්ෂේත්‍ර ආවරණය වී නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් ක්‍රියාකාරකම් අපේක්ෂා කල හැකි පරිදි ඉටුකරගැනීමට නොහැකි වූ බව | සැලසුම් කල පරිදි අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කලයුතු අතරම අභ්‍යන්තර විගණනයේ සොයා ගැනීම් ආයතනයේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමටත්, කළමනාකරණය ක්‍රියා කළ යුතුය |

### 4.2 අයවැය පාලනය

| විගණනනිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| .වැය විෂයයන් 18 කට අදාළව එකතුව රු.27,358,000 ක ප්‍රතිපාදිත මුදලින් රු.9,533,343 ක් උපයෝජනය කිරීම හේතුවෙන් රු.17,824,657 ක ඉතිරියක් හා වැයවිෂයයන් 03කට අදාළව එකතුව රු.3,265,000ක් වූ ප්‍රතිපාදන ඉක්මවා රු.4,086,272ක් වියදම් කිරීම හේතුවෙන් එකතුව රු821,272ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබුණි | වැය විෂයන් 5 ට අදාල රු 8,979,290 ක් වූ විචලනයක් ලෙස දැක්වීම නිවැරදි විය යුතු බව. | අයවැය ඇස්තමේන්තුගත සීමාවන් තුළ වියදම් දැරීමට ක්‍රියා කළ යුතුය. |